ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ **සන්නිවේදන දෙපාර්තමේන්තුව**

දිනය **2014 අගෝස්තු 01**

**මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම පිළිබඳ යාවත්කාලීන කිරීම: 2014 ජූලි**

මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය 2014 ජූලි මස තුළදී සුවිශේෂී ප්‍රගතියක් අත්පත්කර ගත්තේය.

- **ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ ඒකාබද්ධ කිරීම් සහ අත්පත්කර ගැනීම් පිළිබඳ සැලසුම්:** බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් (බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වේ) විසින් යොමුකරන ලද යෝජිත ඒකාබද්ධ කිරීම්/අත්පත්කර ගැනීම් පිළිබඳ සැලසුම් ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාලෝචනයට සහ ඇගයීමට ලක්විය. මෙලෙස ඉදිරිපත් කරන ලද යෝජිත සැලසුම් තුළ, කාල පරාස සහ මිල ඇගවීම් ද ඇතුලත්ව අත්පත්කර ගැනීම් පිළිබඳ තොරතුරු, බැංකු නොවන මූල්‍ය ආයතන අතර ඒකාබද්ධවීම්, වර්තමාන කොටස්කරුවන් මගින් අපේක්ෂිත නව ප්‍රාග්ධනය හඳුන්වාදීම් සහ නව ආයෝජකයන් මගින් ප්‍රාග්ධනය හඳුන්වාදීම් පිළිබඳ කරුණු ඇතුලත් විණි. ඉහත සඳහන් යෝජිත සැලසුම්වලට අදාළව මෙම මස තුළදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකාරිත්වය, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා පැවැත් වූ අතර, මින් ඇතැම් සාකච්ඡා අපේක්ෂිත ඒකාබද්ධවීම්/අත්පත්කර ගැනීම්වලට සම්බන්ධ සමාගම් සමඟ පැවැත් වූ ඒකාබද්ධ සාකච්ඡා විය. ව්‍යාපාර ඒකාබද්ධවීම් පිළිබඳ එකඟතාවයකට එළැඹුනු බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන සමඟ පැවති සාකච්ඡාවන්හිදී, ගනුදෙනු නිශ්චය කිරීම සඳහා අදාළ කාල පරාසයන් සහ පශ්චාත් ඒකාබද්ධ කිරීම් වකවානුව තුළදී ඉදිරි ගමන්මග යනාදී කරුණු සාකච්ඡාවට බඳුන් විය. මෙයට අමතරව, තවත් ඒකාබද්ධ කිරීමේ සැලසුම් කිහිපයක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දුන්නේය. සමස්තයක් ලෙස මේ සම්බන්ධයෙන් ලැබූ ප්‍රගතිය පහත පරිදි වේ.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත්කරන ලද විගණන ආයතන විසින් බැංකු නොවන මූල්‍ය ආයතන 38 කට අදාළව තොරතුරු පත්‍ර, යථා තත්ත්ව පරීක්ෂණ වාර්තා සහ ව්‍යාපාර තක්සේරු වාර්තා සම්බන්ධ කටයුතු සම්පූර්ණ කළේය.

- ශ්‍රී ලංකා මහ බැංකුව, ඒකාබද්ධ කිරීම් සඳහා උනන්දුවක් දැක්වූ පාර්ශව 40 ක් සමඟ තොරතුරු හෙළිදරව් නොකිරීමේ ගිවිසුම්වලට එළැඹීමෙන් අනතුරුව, ඔවුන් වෙත ඉහත සඳහන් වාර්තා ලබාදෙන ලදී.

- ඒකාබද්ධ කිරීම්/අත්පත්කර ගැනීම් සහ ප්‍රාග්ධනය හඳුන්වාදීම් සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන 57 ක් සහ බැංකු 12 ක් තම සැලසුම් යොමු කර ඇත.

- ඒකාබද්ධ කිරීමේ සැලසුම් 19 ක් සඳහා මුදල් මණ්ඩලය ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදුන් අතර, අදාළ සමාගම් විසින් ඒකාබද්ධ කිරීමේ/අත්පත්කර ගැනීමේ ක්‍රියාවලීන්හි කටයුතු සිදුකෙරෙමින් පැවතුනි.

- බැංකු නොවන මූල්‍ය ආයතන 19 ක්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තම සැලසුම් භාරදීමේ අපේක්ෂාවෙන්, එයට අදාළ අභ්‍යන්තර ක්‍රියාවලීන්හි කටයුතු සම්පූර්ණ කර ඇත.

- **ගනුදෙනු කළමනාකරණය අඛණ්ඩව සිදුකිරීම:** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත්කරන ලද විගණන ආයතන, අදාළ ගනුදෙනු සම්බන්ධව මෙන්ම ඒකාබද්ධකරණයෙන් අනතුරුව යහපත් අනුගතවීමක් ඇති කිරීම සඳහා බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන වෙත උපදෙස් ලබාදෙමින්, අඛණ්ඩව ගනුදෙනු කළමනාකරණ කටයුතු සඳහා සහාය විය.

- **ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සඳහා මිල පිළිබඳ මාර්ගෝපදේශ ලබාදීම:** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත්කරන ලද විගණන ආයතන මගින් සිදුකරන ලද ව්‍යාපාර තක්සේරුකරණයන් මත පදනම්ව, යෝජිත අත්පත්කර ගැනීම් සහ ඒකාබද්ධ කිරීම් සම්බන්ධයෙන් මිල පිළිබඳ මාර්ගෝපදේශයන් ලබාදෙන ලදී. ඒකාබද්ධ කිරීමේ ගනුදෙනු පිළිබඳ සාධාරණ අගයක් යටතේ අවසන් එකඟතාවයකට එළැඹීමට පහසුකම් සැලසීමට සහ අනාගතයේදී මූල්‍ය පද්ධති ස්ථායීතාවය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ හැකි අධික මිල තත්ත්වයන් වැළැක්වීමට මෙලෙස මාර්ගෝපදේශ ලබාදෙන ලදී.

- **ක්ෂුද්‍ර මූල්‍ය අංශය:** ඉහළ ප්‍රාග්ධනයක්, වඩා පුළුල් වත්කම් පදනමක් සහ සෑහීමකට පත්විය හැකි යහපාලන ව්‍යුහයන් සහ පරිචයන් යටතේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයෙහි නිරත වීමට ආයතන 03 කට මේ වනවිට ප්‍රතිපත්තිමය අනුමැතිය ලබාදී ඇත.

- **මේ වනවිට සිදුවෙමින් පවතින ඒකාබද්ධවීම් පිළිබඳ කටයුතු:** ඩීඑෆ්සීසී බැංකුව, ඩීඑෆ්සීසී වර්ධන බැංකුව සහ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ඒකාබද්ධවීම සහ මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී, එම්බීඑස්එල් සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ් සහ එම්සීඑස්එල් ෆයිනෑන්ෂියල් සර්විසස්

ලිමිටඩ් සමග ඒකාබද්ධවීම පිළිබඳ කටයුතු මෙම මස තුළදී තවදුරටත් සිදුකරන ලදී. අදාළ ගනුදෙනු සාර්ථකව නිමාවට පත්කිරීම සඳහා අදාළ නීතිමය සංශෝධන හඳුන්වාදීම් සහ අවසර ලබාදීම් පිළිබඳ කටයුතු සිදුකරන ලද අතර, ඒකාබද්ධ කිරීමේ කටයුතු සඳහා විශේෂඥ ආයතන වල සේවාව ලබාගන්නා ලදී. ඇසෙට්ලයින් ලීසිං කම්පැණි ලිමිටඩ් විසින් ලිස්වින් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් අත්පත්කර ගැනීම සහ ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ් විසින් ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ් අත්පත්කර ගැනීමට අදාළ කටයුතු තවදුරටත් සිදුවිණි.

- **නව ගනුදෙනු පිළිබඳ දැනුම්දීම්:** එකඟතාවයන්ට එළැඹුනු ඒකාබද්ධ කිරීමේ සැලසුම් පිළිබඳව ඇතැම් බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන නිවේදන නිකුත් කරන ලදී. මේ අතර, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී විසින් ඉන්ද්‍රා ෆිනෑන්ස් ලිමිටඩ් අත්පත්කර ගැනීම සහ දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැණි ලිමිටඩ් විසින් ජෝර්ජ් ස්ටුවර්ට් ෆිනෑන්ස් පීඑල්සී අත්පත්කර ගැනීම පිළිබඳ නිවේදන අඩංගු විය.

- **කල්බදු ව්‍යාපාරයෙහි නිරතවීමට ලබාදී තිබූ බලපත්‍රය අවලංගු කිරීම:** කොෂීබා ලීසිං කම්පැණි ලිමිටඩ් වෙත කල්බදු ව්‍යාපාරයෙහි නිරතවීමට ලබාදී තිබූ බලපත්‍රය, අදාළ සමාගම ඒකාබද්ධකරණ සැලසුම යටතේ තවදුරටත් තම මෙහෙයුම් සිදු කිරීමට අකමැත්ත පළ කිරීම හේතුවෙන්, එකී සමාගමෙහි ඉල්ලීම මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවලංගු කරන ලදී.

- **සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ඒකාබද්ධකරණ ක්‍රියාවලියට ඇතුලත් කිරීම:** මෙම මස තුළදී අභියාචනාධිකරණය විසින් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට එරෙහිව පනවා තිබූ වාරණ නියෝගය ඉවත් කළේය. මේ අනුව, අදාළ සමාගම ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන සැලසුමට ඇතුලත් කර තිබෙන අතර, එකී සමාගම සඳහා ගොඩනගන ලද නව සැලසුමකට අනුකූලව, ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරි මාස කිහිපය තුළදී ආරම්භ කෙරෙනු ඇත.

- **බදු ප්‍රතිලාභ:** ඒකාබද්ධකරණ ක්‍රියාවලියට සහායවීම සඳහා හඳුන්වාදෙනු ලබන 2014 අංක 8 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතට සහ 2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතට අදාළ බදුකරණය පිළිබඳ මාර්ගෝපදේශයන් සඳහා මුදල් මණ්ඩලයෙහි අනුමැතිය ලැබුණු අතර ඒවා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙහි එකඟතාවය ලැබීමෙන් අනතුරුව ඉදිරියේදී නිකුත් කිරීමට නියමිතය.

- **ඒකාබද්ධකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ප්‍රතිචාරය:** ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් නොබෝදා නිමාවට පත්කළ දූත සංචාරයට අදාළ වාර්තාවේ වර්තමාන මූල්‍ය අංශය හා සම්බන්ධ ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සුභවාදී ප්‍රතිචාරයක් පළ කළ අතර, මෙම වැඩසටහන මගින් මූල්‍ය පද්ධතියෙහි ශක්තිමත්භාවය ඉහළ නැංවීමට සහ ඵලදායී අධීක්ෂණයක් සඳහා දායකවීමට අවස්ථා සැලසෙන බව පෙන්වා දෙන ලදී.